# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1908/23 - 2015 මාර්තු මස 31 වැනි අඟහරුවාදා - 2015.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xii)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

**27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) උපවගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, 2014 මාර්තු 31 දින අංක 1856/5 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමය මඟින් අවසන් වරට සංශෝධිත 1995 නොවැම්බර් 7 දින අංක 896/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට අදාළ එකී පනතේ 21 වන වගන්තිය යටතේ වූ උපලේඛනයේ I වන තීරයේ සහ එහි II වන තීරයේ අනුමත සටහනේ සඳහන් වන "සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය" යන අයිතමය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| "*I වන තීරය* *පීඨය* | *II වන තීරය* *අධ්‍යයන අංශය* |
|---|---|
| සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | 1. සමාජ විද්‍යා අධ්‍යයන අංශය<br>2. මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය<br>3. පුරාවිද්‍යා හා උරුම පිළිබඳ කළමනාකරණ අධ්‍යයන අංශය<br>4. පාරිසරික කළමනාකරණ අධ්‍යයන අංශය<br>5. භාෂා අධ්‍යයන අංශය." |

ආචාර්ය සරත් අමුණුගම,
උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය.

2015 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

04-546

1A - PG 2423 — 503 (2015/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.